**15. ශීර්ෂය 15 -නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

**15.1 විගණන විෂය පථය**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**15.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**15.3 විගණන නිරීක්ෂණය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) යටතේ දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 15.4 සිට 15.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

(i) එක් වැය විෂයයක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.65,066,000 ක් වූ සම්පූර්ණ මූලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 33 ක සිට සියයට 35 ක් දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 15.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 15.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.
මේ සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් මාසයේදී නීති කෙටුම්පත් සම්පාදක විසින් පහත සඳහන් අන්දමට මා වෙත වාර්තා කර තිබුණි.

“විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පත් හා පළාත් සභා වලින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් මත ඒ ඒ වර්ෂයේදී පනත් පිළියෙල කිරීම සිදු වේ. ඒ අනුව ඉදිරි වර්ෂ තුනක් සඳහා පනත් කෙටුම්පත් කිරීමේ සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගිකව අපහසු වී ඇත.”

### 15.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 15.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ

සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 සැප්තැම්බර් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 15.4.3 අභ්‍යන්තර විගණනය

----------------------

දෙපාර්තමේන්තුව සතුව අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබූ අතර ජනාධිපති ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර තිබුණි.

### 15.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

---------------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.72,500,000 ක් වූ ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා ආරම්භ කර නොතිබුණි.

### 15.6 කාර්යසාධනය

----------------

2012 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පහත දැක්වේ.

| රාජකාරියේ ස්වභාවය | 2012 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව | 2012 වර්ෂයේදී පාර්ශව වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දින වන විට කෙටුම්පත් සකස් කර අදාල පාර්ශව වෙත භාර දුන් සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අණ පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 123 | 40 | 37 | 126 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පනත් | 79 | 41 | 55 | 65 |
| උපකාරක නීති | 59 | 121 | 69 | 111 |
| පළාත් සභා ප්‍රඥප්ති | 12 | 4 | 5 | 11 |
| එකතුව | 273 | 206 | 166 | 313 |

2012 වර්ෂයේදී පනත් කෙටුම්පත් 92 ක් සකස් කර තිබූ අතර, පනත් 23 ක් පාර්ලිමේන්තුව මගින් සම්මත කර කථානායකවරයා විසින් සහතික කර තිබුණි.

## 15.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 |
| (ආ) තෘතියික මට්ටම | 28 | 04 | 24 |
| (ඇ) ද්විතියක මට්ටම | 62 | 32 | 30 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 24 | 18 | 06 |
| එකතුව | 151 | 81 | 70 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 70 ක් සම්පූර්ණ කළ යුතුව තිබුණි